**ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුව**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්වාගණනය නොකල මතය**

**-----------------------------------**

වාණිජ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 පෙබරවාරි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය නොකල මතය සඳහා පදනම**

-------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**--------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ ලෙ◌ෙදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වැය විෂයන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹිය නොහැකි වුවත් පුනරාවර්තන වැය විෂයන් 02 ක් සඳහා ඉතිරිය ඉක්මවා එකතුව රු.1,883,623 ක් වූ බැරකම් වලට එළඹී තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වැය විෂයන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොඑළඹිය යුතුය. | 2018 වර්ෂයට අදාළ බැරකම් සමාලෝචිත වසර මුලදී නිරවුල් කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මෙම තත්වය උදා වී ඇත. ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති වීම අවම කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව සටහන් අංක (iii) යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂ වලට අදාළව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟවිය යුතු නමුත් එම ලේඛණ 02 අතර රු.2,529,277 ක වෙනසක් පැවතුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමඟ දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛණය වෙනස් වීමට බලපා ඇත්තේ භාණ්ඩාගාරයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ සඳහන්ව නැති වැය විෂයන් යටතේ වන බැඳීම් හා බැරකම් වලට අදාළ සේවාවන් ලබා ගැනීමයි. |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත්වල දැක්වෙන ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂය අතර රු.291,367 වෙනසක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය එකිනෙකට සමාන විය යුතුය. | මෙම වෙනස පෙර වර්ෂ වල සිට පැවත එන්නකි. මේ හේතුවෙන් 2005 වසරේ සිටම ගිණුම් නොසැසඳෙන බැවින් එය නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අතර ඊට කාලයක් ගත වේ. ඉදිරි වසරේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. |
| (ආ) විදේශ දූත මණ්ඩල සේවයේ නියුතු නිලධාරියෙකුගේ 2019 අගෝස්තු මාසයේ සිට රු.243,512 ක්වූ ණය ශේෂයට අදාලව වාරික අයකිරීම් 2019 දෙසැම්බර් 31 දින දක්වා සිදුකර නොතිබුණි. | විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් අදාළ තොරතුරු ලබා ගෙන දෙපාර්තමේන්තු පොත් වල සටහන් කිරීමට කටයුතු කළ යුතුය. | එක් නිලධාරියෙකු 2019 අගෝස්තු මස සිට විදේශ දූත මණ්ඩල සේවයේ නියුක්තව ඇති බැවින් එම නිලධාරියාගේ ණය වාරික අයකිරීම් එදින සිට විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සිදුවේ. එම විස්තර අප දෙපාර්තමේන්තුව වෙත එවා නොමැති බැවින් දෙපාර්තමේන්තු පොත් වල සටහන් කිරීමට නොහැකි වී ඇත. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) වෙළඳ පිළියම් කටයුතු සිදු කිරීම සඳහා වෙළඳ ප්‍රතිකර්ම ඒකකයක් පිහිටුවා තිබුණද, ක්‍රියාකාරී සැළැස්මේ දක්වා ඇති පරිදි එම ඒකකයට ආර්ථික විශේෂඥයෙකු බඳවා ගැනීම මෙන්ම පනතට අදාළ රෙගුලාසි සෑදීමේ කටයුතු නිම කිරීම සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැළැස්මේ දක්වා ඇති කාර්යයන් අදාළ වර්ෂය තුළදී ඉටු කළ යුතුය. | පුවත්පත් දැන්වීමක් මගින් ආර්ථික විශේෂඥයෙකු බඳවා ගැනීමට කටයුතු සකස් කරමින් පවතී. පනතට අදාළ රෙගුලාසි සැකසීමද සිදු කරමින් පවතී. වෙළඳ පිළියම් පනත 2020 ඔක්තෝබර් 19 සිට බලාත්මක කිරීමට විෂයභාර අමාත්‍යවරයා 2020 ඔක්තෝබර් 09 දින අත්සන් තබන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා කාර්යසාධන දර්ශක 14 ක් හඳුනාගෙන තිබුණි. මෙයින් අන්‍යෝන්‍ය නොවන වෙළඳ ගිවිසුම් යටතේ තීරු බදු සහන අත් කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම, අන්‍යෝන්‍ය වෙළඳ ගිවිසුම් යටතේ තීරු බදු සහන අත් කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම, බහුපාර්ශවීය තලය හමුවේ ශ්‍රී ලංකාවේ අභිරුචිය ආරක්ෂා කිරීම, වාර්තා කරන ලද වෙළඳපොළ ප්‍රවේශය සම්බන්ධ ගැටළු සඳහා මැදිහත්වීම හා විසඳීම යන දර්ශක 04 සඳහා ඉලක්ක තීරණය කර නොතිබුණු අතර එම කාර්යයන් ඉටු කිරීමටද කටයුතු කර නොතිබුණි. | කාර්යසාධන දර්ශක වලට අදාළ ඉලක්ක තීරණය කර ඒවා ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම කාර්යයන් 04 හි ස්වභාවය අනුව එක් ඉලක්කයක් සැපයීම ප්‍රායෝගිකව අපහසුය. අනුමාන කළත් ඉලක්ක සැපයිය නොහැක. මෙම කටයුතු පවතින රජයේ ප්‍රතිපත්ති රාමුව මත ඉටු කරගෙන යනු ලබයි. පවතින රජයෙන් මගපෙන්වීමක් නොලදහොත් ඒවා ඉටු නොකෙරේ. |

**3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ----------------------------------------- |
| (අ) | පවත්වන ලද ඒකාබද්ධ කමිටු රැස්වීම් වාර ගණන සහ ශ්‍රී ලංකාවේ පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා සහභාගී වීම, මිලදීගැනීමේ විදේශ දූත කණ්ඩායම් සංවිධානය කිරීම යන කාර්යසාධන දර්ශක ලඟා කර ගැනීමේ ප්‍රගතිය සියයට 40 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි. | ක්‍රියාකාරී සැළැස්මේ දක්වා ඇති ප්‍රගතිය ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඒකාබද්ධ කමිටු රැස්වීම් සියල්ලම එක් අවුරුද්දක් තුළ පැවැත්වීම අපහසුයි. එම නිසා වර්ෂයට අදාළ සියළුම ඒකාබද්ධ කොමිෂන් ඉලක්ක ලෙස ගනු ලබයි. එයින් ප්‍රායෝගිකව පවත්වන්නේ 2 ක් හෝ 3 ක් පමණි. වෙළඳ සල්පිල් වලද තත්වය මීට සමාන වේ. එම නිසා සියයට 40 ක ප්‍රතිශතයක් පිළිබිඹු වේ. |
| (ආ) | වරණීය නොවන ප්‍රභවස්ථාන රීති රාමුවක් පිළියෙල කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව හා අනෙකුත් අදාළ ආයතන සමඟ එක්ව ක්‍රියාපටිපාටියක් සකස් කිරීම 2018 වසරේ ක්‍රියාකාරී සැළැස්මේ දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එය සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැළැස්මේ දක්වා ඇති කාර්යයන් අදාළ වර්ෂය තුළදී ඉටු කළ යුතුය. | 2019 දී මෙම නීති මගපෙන්වීම් නැවත සකස් කිරීමට සිදු විය. මේ පිළිබඳව ශ්‍රී ලංකා රේගුව සමඟ සාකච්ඡා ආරම්භ කළත් මෙහි සංකීර්ණ බව හේතුවෙන් ගැඹුරින් අධ්‍යනය කිරීම අවශ්‍ය වේ. එම නිසා මෙම කටයුත්ත 2019 දී සම්පූර්ණ කිරීමට නොහැකි විය. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෘහිත කරන ලද 2018 ජනවාරි 17 දිනැති අංක 01/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් ලබා දෙන සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු පසුගිය වසර 03 කාලයක් තුල සංශෝධනය කර නොමැති නම් එම ගාස්තු සියයට 15 කින් සංශෝධනය කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් උකස් පනත යටතේ ණයදෙන ආයතන අනුමත කිරීම සඳහා අය කරන ගාස්තුව 2003 ජුනි 09 වන දිනද, අනෙකුත් ගාස්තු 2014 ජනවාරි 01 දිනද අවසන් වරට සංශෝධනය කර තිබුණි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෘහිත කරන ලද 2018 ජනවාරි 17 දිනැති අංක 01/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු සංශෝධනයට කටයුතු කළ යුතුය. | ගාස්තු සංශෝධනය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ආ) 1949 අංක 06 දරන උකස් පනත, 1947 අංක 12 දරන භාරකාර ආඥා පනත හා 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත යටතේ ණය දෙන ආයතන නිර්දේශ කිරීමේ කමිටුවේ නිර්දේශ මත ණයදෙන ආයතන ප්‍රකාශයට පත් කිරීමේ බලය වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරී ඇත. ඒ අනුව 1973 සැප්තැම්බර් සිට 2019 දෙසැම්බර් දක්වා උකස් පනතේ 114(1) වගන්තිය ප්‍රකාරව ණයදෙන ආයතන 391 ක් නිර්දේශ කර ප්‍රකාශයට පත් කර තිබුණි. මෙම සියළුම ආයතන වර්තමානයේත් ක්‍රියාත්මක වන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා නැවත ලියාපදිංචි අලුත් කරවා ගැනීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම ආයතනවල ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය සමාලෝචනය කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත කරනු ලබන ණය දෙන ආයතන වල කටයුතු නියාමනයට යාන්ත්‍රණයක් සකස් කිරීම හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු පවත්වා ගත යුතුය. | 2019 වර්ෂයේ සිට ණය දෙන ආයතන නිර්දේශ කිරීමේදී නිර්දේශ මණ්ඩලය විසින් තම නිර්දේශ වසර 03 කාලසීමාවක් සඳහා බලපැවැත්වෙන පරිදි ලබාදෙන බැවින් ඔවුන් නැවත ලියාපදංචිය සඳහා අයදුම් කිරීමේදී ඔවුන්ගේ මූල්‍ය තත්වය පිළිබඳ අධ්‍යානය වීමක් සිදු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව 1949 අංක 06 දරන උකස් පනත ක්‍රියාත්මක කරවීම කිසිදු අමාත්‍යාංශයක විෂය පථයට අයත් නොවීම හේතුවෙන් එකී පනතේ 114 පරිච්ඡේදය ප්‍රකාරව ණය දෙන ආයතන අනුමත කිරීමේ කාර්යය එදින සිට ඇණහිට තිබුණි. | ණය දෙන ආයතන අනුමත කිරීමේ කාර්යය අඛණ්ඩව කරගෙන යාමට ඇති බාධාව කඩිනමින් ඉවත් කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම කාර්යය තවදුරටත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට මුදල් අමාත්‍යාංශය යටතේ ගැසට් කර මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර ඇත. |

**3.4 වෙනත් නිරීක්ෂණ**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------------------- |
| (අ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉදිරිපත් කළ යුතු ප්‍රගති වාර්තා 2017 ජනවාරි 13 දිනැති අංක 01/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2018 මාර්තු 05 දිනැති අංක (1)/01/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳව සංසන්දනාත්මකව නිරීක්ෂණය කළ නොහැකි විය. | 2017 ජනවාරි 13 දිනැති අංක 01/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2018 මාර්තු 05 දිනැති අංක (1)/01/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුලදී ඉටු කළ කාර්යයන් ඇතුළත් වාර්තාවක් ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව. |
| (ආ) | විදේශ වාණිජ නියෝජනය කිරීමේ කාර්යය එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල 30 ක් නියෝජනය කරන නිලධාරීන් 32 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම දූත මණ්ඩල වලින් ඉටු කළ යුතු කාර්යයන් 19 ක් ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති අතර එම කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා එක් එක් විදේශ වාණිජ නිලධාරීන්ගේ කාර්යසාධනය පිළිබඳ ප්‍රගති වාර්තා ඉදිරිපත් නොවුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු අතර ඒ අනුව ප්‍රගති වාර්තා පිළියෙල කිරීම කළ යුතුව ඇත. | ක්‍රියාකාරී සැලැස්ම අනුව එක් එක් වාණිජ නිලධාරීන් විසින් 2019 වසර තුලදී ඉටු කළ කාර්යයන් ඇතුළත් වාර්තාවක් ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමණාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක **DMA/**01-2019 දරන චක්‍රලේඛයේ 5.3 ඡේදය අනුව වර්ෂයක් තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් පැවැත්විය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වසර තුළ එක් කමිටුවක් හෝ පවත්වා නොතිබුණි. එසේම රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින්ද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර වාර්තා නිකුත් කර නොතිබුණි. | 2019 ජනවාරි 12 දිනැති අංක **DMA/**01-2019 දරන චක්‍රලේඛයට අනුගතව කටයුතු කළ යුතුය. | මෙම දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර රේඛීය අමාත්‍යාංශය මගින් එම කටයුතු සිදු කරයි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අනුමත කාර්ය මණ්ඩලය 152 ක් වූ මෙම දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 10 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 01 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 17 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 05 ක්ද ඇතුළුව තනතුරු 33 ක පුරප්පාඩු පැවති අතර එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 22 ක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට අවශ්‍ය වන්නා වූ කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි වී තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ශ්‍රේණියේ ඉහළම තනතුර වන වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2019 සැප්තැම්බර් 11 දින සිට පුරප්පාඩු විය. එදින සිට වැඩබලන අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා, වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම සිදු කළ නමුත් 2020 මැයි 30 දින එම නිලධාරියාද විශ්‍රාම යාම මත වාණිජ අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු දෙකම පුරප්පාඩු විය. මෙලෙස විධායක මට්ටමේ ඉහළම තනතුරු දෙකම පුරප්පාඩුව පවතින තත්වයක් තුළ ශ්‍රී ලංකාව තුල සේවය කරමින් සිටි ජ්‍යෙෂ්ඨතම හා එකම වාණිජ අධ්‍යක්ෂවරයා වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර තිබුණි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කොට රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබූ නමුත් මේ දක්වාම අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී නොතිබුණි. | ඉහළ කළමනාකරණයේ පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කල යුතුය. | -එම- |
| (ඇ) | අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (I)) තනතුර අනුමත කළ දින (2014 ජුනි 25) සිට මේ දක්වාම පුරප්පාඩුව පවතී. මේ සඳහා නිලධාරියෙකු අනුයුක්ත කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කිහිපයක්ම ඉදිරිපත් කර තිබුණු නමුදු මේ දක්වාම එම පත්වීම සිදු කර නොමැත. තවද, සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුරු 06 ක් පුරප්පාඩුව පවතින අතර බඳවා ගැනීම් කටයුතු සඳහා විභාගයක් පැවැත්වීමට අවශ්‍ය දැන්වීම විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණි. මෙම පුරප්පාඩු පියවා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් විදේශ දූත මණ්ඩල නියෝජිතයන් පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කරනු ලබන බව නිරීක්ෂණය විය. | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම ආයතනයේ කාර්ය සාධනයට බලපාන බැවින් අදාල තනතුර සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2018 ජුනි 01 සිට 2019 සැප්තැම්බර් 10 දක්වා වාණිජ අධ්‍යක්ෂවරයෙකු වැඩ බැලීමේ පදනම මත පත් කර තිබුණි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (I) තනතුර සඳහා නිලධාරියෙකු පත් කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති අතර සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුරු 06 ට බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |